# 6.3.3 කෝට්ටේ රාජධානියේ පරිහානියට බල පෑ හේතු



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# කෝට්ටේ රාජධානියේ පරිහානියට බල පෑ හේතු

කෝට්ටේ රාජධානියේ පිරිහීම අටවන වීර පරාක්‍රමබාහු රජුගෙන් පසු ක්‍රමයෙන් සිදුවිය. ඒ දක්වා කෝට්ටේ රජු ලංකාවේ අගරජු විය.

16 වන සියවස වන විට ලංකාවේ ප්‍රධාන රාජ්‍යය කෝට්ටේ වූ අතර උඩරට රාජ්‍යය හා යාපන රාජ්‍යය ලෙස පාලන ඒකක 3 ක් විය. මීට අමතරව වන්නි පාලකයෝ ද සිටියහ. නමුත් ලංකාවේ ප්‍රධාන රාජ්‍ය වූයේ කෝට්ටේ රාජ්‍යය යි.

අටවන වීර පරාක්‍රමබාහු රාජ්‍ය සමය අවසාන කාලය වනවිට උඩරට සහ යාපනය පාලකයන් වාර්ෂිකව පුද පඬුරු රැගෙන කෝට්ටේ රජු බැහැ දැකීමට පැමිණීමේ සිරිත මේ වනවිට අඩුවෙන් පැවතුණි.

එනම් ප්‍රාදේශීය නායකයන් බලවත් විය. කෝට්ටේ අටවන වීරපරාක්‍රමබාහු රජුගෙන් පසු vi වන විජයබා රාජ්‍ය කාලය වන විට මුහුදුබඩ ප්‍රදේශවලට වරින්වර පෘතුගීසි බලපෑම් එල්ල විය.

Copyright www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අභ්‍යයන්තර ආරවුල් රැසකට මුහුණ දීමට කෝට්ටේ රාජ්‍යයට සිදුවිය.
( අටවැනි වීර පරාක්‍රමබාහු රජතුමා යටතේ විස්තර කර ඇත.)

- 1521දී විජයබා කොල්ලයේ ප්‍රතිඵලයක් ලෙස කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදුණි.

- 1521විජයබා කොල්ලයක් සමඟ දුබල වෙමින් පැවති කෝට්ටේ රාජධානියේ පිරිහීම වර්ධනය වන්නට විය.
- විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජ්‍යය කොටස් 3 කට බෙදී ගියේ ය.




1521 ලංකාව දේශපාලන බෙදීම

Copyright www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- මේ අනුව විජයබා කොල්ලය කෝට්ටේ රාජ්‍යය පිරිහීමට ප්‍රබල හේතුවක් විය.

  මේ අනුව පිරිහෙමින් තිබු කෝට්ටේ රාජ්‍යය කොටස් 3 කට බෙදීයාමට සිදුවිය.

  - කෝට්ටේ- vii වන බුවනෙකබාහු
  - රයිගම- රයිගම් බණ්ඩාර
  - සීතාවක- මායාදුන්නේ

- මේ නිසා කෝට්ටේ රාජ්‍යය කුඩා විය.
- ආර්ථික හා යුද්ධ බලය බෙදී යාමෙන් කෝට්ටේ දුබල විය.
- මේ රාජ්‍ය තුන අතර නිරන්තර ආරවුල් ඇතිවිය.
- කෝට්ටේ හා සීතාවක අතර නිරන්තර තරගයක් උදාවීම. කෝට්ටේට විරුද්ධව සීතාවක බල අරගලය නිසා පරංගි බලය ලංකාවේ මුල් බැස ගැනීම.
- මේ රාජ්‍ය තුනට ම වඩා මහනුවර රාජ්‍යය පුළුල්ව යැම ද මේ වනවිට සිදුවිය.
- සීතාවක වැනි සුළු රාජ්‍යයකින් තෘප්තිමත් නොවු මායාදුන්නේ කුමරුගේ අපේක්ෂාව වූයේ තම රාජ්‍යය පුළුල් කර ගැනීම යි. මේ නිසා ඔහු කෝට්ටේ රාජ්‍යයට පහරදීමට ඉදිරිපත් විය.

- පළමුව රයිගම් බණ්ඩාර හා එක්ව කෝට්ටේට පහර දුනි.
- සීතාවක මායාදුන්නේ කෝට්ටේට විරුද්ධව දරුණු යුද්ධයක් කළ අතර කෝට්ටේ රජු පෘතුගීසින්ගේ සහය ලබා ඇත.
- 1526-1539 දක්වා කීප අවස්ථාවක් මායාදුන්නේ රජු කෝට්ටේට කඩා වැදී ඇත.
- කෝට්ටේ බුවනෙකබාහු රජු තම සොහොයුරන් නොසලකා හැර පෘතුගීසීන්ගේ සහාය ලබා ගැනීමත් ඔවුන්ට පක්ෂපාතිවීමත් සිදුවිය
- මායාදුන්නේ කුමරු ඉන්දියාවේ මුස්ලිම්වරුන්ගේ සහාය ලබා ගෙන ද කෝට්ටේ රජුට විරුද්ධව සටන් කර ඇත.
- බුවනෙකබාහු රජුට පුතෙකු නොවු අතර දියණිය වන සමුද්‍රදේවියගේ පුතු වූ ධර්මපාල කුමරුට රජකම ලබාදීම රජුගේ අපේක්ෂාව විය. එය මායාදුන්නේ රජුට කෝට්ටේ රාජ්‍ය අහිමි වීමේ පෙරනිමිත්තක් විය. මේ මතභේදය ද කෝට්ටේ රාජ්‍යයට විරුද්ධව ප්‍රහාර එල්ලවීමට හේතු විය.
- සොහොයුරන්ගේ තර්ජන නිසා ධර්මපාල කුමරුට ආරක්ෂාව ලබාදීම, අධ්‍යාපනය ලබා දීම හා රජකමට පුහුණු කිරීමට බුවනෙකබාහු රජු පෘතුගීසීන්ට පවරාදෙන ලදී.
- පෘතුගීසින්ගෙන් සලසා ගන්නා ආරක්ෂාව වෙනුවෙන් කෝට්ටේ රාජ්‍යය තුළ ක්‍රිස්තියානි ආගම පැතිරවීමට ද බුවනෙකබාහු රජු ඉඩ දී ඇත. එය ද කෝට්ටේ රාජධානිය වෙත පෘතුගීසි බලපෑම් එල්ල වීමට හේතු විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- 1551 බුවනෙකබාහු රජුගේ හදිසි මරණයෙන් පසු ධර්මපාල කුමරු කෝට්ටේ රජවිය. **ධර්මපාල රජු 1557 දී බුදුදහම අතහැර බෞතිස්ම වීම කෝට්ටේ පරිහානියට ප්‍රබල හේතුවක් විය.** ( සිංහල රජු බෞද්ධයකු විය යුතුය යන චිරාගත සම්ප්‍රදාය ඔහු කඩ කළේය.)

- ඒ නිසා බෞද්ධ සහයෝගය සීතාවකට හිමි විය.

- කෝට්ටේ තිබූ දළදා වහන්සේ මායාදුන්නේ රජුට ලැබීම. දළදා හිමිකරු රටේ නියම පාලකයා බව පොදුජන විශ්වාසය යි.

- 1561 මුල්ලේරියා සටනින් කෝට්ටේ බලය බොහෝ සෙයින් ඇද වැටිණි. මුල්ලේරියා සටනින් සීතාවක කීර්තිය ලියලා කෝට්ටේ පිරිහීම ඉක්මන් විය.

- පණ අදිමින් තිබූ කෝට්ටේ රාජ්‍යයට අවසාන ප්‍රහාරය 1565 වැදුණි. සීතාවක වටලීමෙන් පසු කෝට්ටේ රාජ්‍යය පරාජයට පත්විය.

- 1565 දී පරංගීන් විසින් 1412 පටන් අවුරුදු 153 ක් අගනුවර ලෙස පැවති කෝට්ටේ නුවර මුළුමනින් ම විනාශ කළහ.

- මේ අනුව කෝට්ටේ රාජ්‍යයේ පිරිහීම ක්ෂණිකව වුවක් නොව කාලාන්තරයක් තිස්සේ වූ සිද්ධි මාලාවක ප්‍රතිඵලයක් බව පැහැදිලි වේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk